# අධ්‍යාපන දර්ශනවාදී ගුරුකුල

එච්.ජී.සී. සම්පත්

## හැඳින්වීම

අධ්‍යාපන දර්ශනයේ මූලික කාර්යය වන්නේ අධ්‍යාපනය නිශ්චිත ඉලක්ක කරා යොමු කිරීමයි (Crotty, 2005). එමගින් ගුරුවරයාට යහපත් දැක්මක් නිර්මාණය කළ හැකි අතර පන්ති කාමරය තුළ මනාව සංවිධානය වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ද ගොඩනැගිය හැකි වේ. වෙනත් ලෙසකින් පවසන්නේ නම් අධ්‍යාපන දර්ශනය මගින් සිදු කරනු ලබන්නේ අධ්‍යාපනයේ සිද්ධාන්තමය පදනම සකස් කිරීම යි. භෞතික ලෝකයේ බලපෑම මෙන් ම මතවාදී ලෝකයේ බලපෑම ද අධ්‍යාපනය කෙරෙහි එල්ල වන බව අපි දනිමු. එසේ නම් භෞතික හා අභෞතික ලෝක පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් අධ්‍යාපන කටයුතු වඩාත් සාර්ථක කර ගැනීමටත් අධ්‍යාපන දර්ශනය උපකාරී වන බව අවිවාදිතය. අධ්‍යාපනය පිළිබඳ කරුණු විග්‍රහ කර බැලීම, කරුණු තුලනාත්මකව විශ්ලේෂණය කිරීම, විවේචනාත්මක ස්වරූපයෙන් කරුණු දෙස බැලීම, අධ්‍යාපනය පිළිබඳ සිද්ධාන්තමය පදනම පරීක්ෂා කිරීම මෙන් ම තර්කානුකූලව කරුණු අවබෝධ කරගැනීම ආදියේ දී දර්ශනය පිළිබඳ අවබෝධය වැදගත් වේ (Kristiawan, 2016). මේ අනුව බලන විට අධ්‍යාපනය හා දර්ශනය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් තිබෙන බව පෙන්වා දිය හැකි ය. චන්ද්‍රසේකර (2018) පෙන්වා දෙන ආකාරයට අධ්‍යාපනයේ දාර්ශනික පදනම යනුවෙන් අදහස් කරන්නේ ද අධ්‍යාපනය කෙරෙහි බලපා ඇති පෙර අපර දෙදිග දාර්ශනිකයින්ගේ චින්තාවන් ය. එම දාර්ශනිකයින්ගේ විවිධ චින්තාවන් විවිධ දාර්ශනික ගුරුකුලයන් නියෝජනය කරයි. එම ගුරුකුලයෝ විවිධය හ. ඉන් කිහිපයක් පමණක් මෙහි දී සලකා බැලෙයි.

## ස්වභාවවාදය

ස්වභාවවාදය (Naturalism) යනු භෞතික ලෝකය සහ මිනිසාගේ හැසිරීම් පිළිබඳව පද්ධතිමය සහ පරිකල්පනීය අධ්‍යයනයක්

වන දාර්ශනික ධාරාවකි. ස්වභාවවාදයට අනුව සෑම දෙයක් ම ස්වභාවිකත්වය මත පදනම් වෙයි. භෞතික ලෝකය, එක ම යථාර්ථය වන අතර අධ්‍යාත්මික ලෝකයක පැවැත්ම ප්‍රතික්ෂේප කිරීම ද ස්වභාවවාදීන්ගේ ස්වභාවය බව ගෝපාල් දාස් (Gopal Das, 2024) පෙන්වා දෙයි. ස්වභාවවාදය පිළිබඳ මූලික කරුණු කිහිපයකි. ඒ අතර භෞතික ලෝකය පමණක් සත්‍ය බව, භෞතික විශ්වය සහ එහි නීති පමණක් පවතින බව, ආත්මය, දෙවියන් හෝ වෙනත් අධිස්වභාවික සංසිද්ධීන් නොමැති බව, ස්වභාවික නීති සහ හේතු මත සියලු සංසිද්ධීන් පවතින බව, ස්වභාවික හේතූන් මගින් ස්වභාවික සංසිද්ධීන් පැහැදිලි කළ හැකි බව, විද්‍යාත්මක ක්‍රමවේදයන් සහ නිරීක්ෂණ මගින් ලෝකය පිළිබඳ දැනුම ලබාගත හැකි බව, අධිස්වභාවික සංකල්ප ප්‍රතික්ෂේප කිරීම, මිනිසා ද ස්වභාවික ලෝකයේ කොටසක් වන බව, ඔහුගේ හැසිරීම් සහ ක්‍රියාකාරකම් ද ස්වභාවික නීතිවලට යටත් බව ඉන් ප්‍රමුඛ වේ. රූසෝට අනුව ස්වභාව ධර්මයට ඉහළින් ක්‍රියාත්මක වන දෙවියන් හෝ ආත්මයක් නැති බවත් මිනිසා විසින් නිර්මාණය කළ දිව්‍යඥානය, ආත්මයේ බලය, දේව වචනය දරුවාගේ මනස විකෘති කරනු ලබන බවත් චන්ද්‍රසේකර (2009) පෙන්වා දෙයි.

ස්වභාවවාදය ඉගැන්වූ දාර්ශනිකයින් රැසෙකි. ඇරිස්ටෝටල් (Aristotle - ක්‍රි.පූ. 384 -322) ගේ දර්ශනයේ මූලික ලක්ෂණයක් වන්නේ ස්වභාවික ලෝකය නිරීක්ෂණය සහ විමර්ශනය කිරීම කෙරෙහි දැඩි අවධානය යි. ඔහු විශ්වාස කළේ සත්‍යය අවබෝධ කර ගැනීමට නම්, අප අවට ඇති ලෝකය හොඳින් නිරීක්ෂණය කර අධ්‍යයනය කළ යුතු බව යි. ෆ්‍රැන්සිස් බේකන් (Francis Bacon - ක්‍රි.ව.1561 - 1626) විද්‍යාත්මක ක්‍රමවේදයේ මූලික ලක්ෂණ ලෙස ස්වභාවික සංසිද්ධි පිළිබඳව හොඳින් නිරීක්ෂණය කිරීම සහ දත්ත රැස් කිරීම, උපකල්පන පරීක්ෂා කිරීම සඳහා පාලනය කළ හැකි පරීක්ෂණ පැවැත්වීම, පරීක්ෂණ මගින් ලබාගත් ප්‍රත්‍යක්ෂ සාක්ෂි මත පදනම්ව නිගමනවලට එළඹීම, විශේෂිත නිරීක්ෂණවලින් සාමාන්‍ය නිගමනවලට එළඹීම, පූර්ව නිගමන සහ අගතීන්ගෙන් තොරව විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම ඒ අතර ප්‍රධාන වේ. බේකන්ගේ මෙම ක්‍රමවේදය මගින් විද්‍යාඥයින්ට ස්වභාවික ලෝකය පිළිබඳව වඩාත් නිවැරදි සහ විශ්වසනීය දැනුමක් ලබා ගැනීමට හැකි විය. ඔහුගේ අදහස් විද්‍යාත්මක විප්ලවයේ ආරම්භයට සහ නූතන විද්‍යාවේ දියුණුවට විශාල වශයෙන් දායක

විය. චාල්ස් ඩාවින් (ක්‍රි.ව.1809 - 1882) ගේ න්‍යායේ මූලික සංකල්ප අතර පරිණාමය ප්‍රධාන වේ. ජීවීන් කාලයත් සමඟ වෙනස් වන බව, සියලු ම ජීවීන් පොදු මුතුන්මිත්තෙකුගෙන් පැවත එන බව, පරිසරයට වඩාත් අනුවර්තනය වූ ජීවීන් ජීවත් වීමට සහ ප්‍රජනනය කිරීමට වැඩි ඉඩක් ඇති බව ඒ අතර වේ. තෝමස් හෙන්රි හක්ස්ලි (Thomas Henry Huxley - ක්‍රි.ව. 1825 - 1895) චාල්ස් ඩාවින්ගේ පරිණාමවාදී න්‍යාය ප්‍රචලිත කිරීමට විශාල කාර්යභාරයක් ඉටු කළ තැනැත්තෙකි. ඔහු ඩාවින්ගේ න්‍යාය ප්‍රබල ලෙස ආරක්ෂා කළ අතර, එය ජනප්‍රිය කිරීමට සහ විද්‍යාත්මක ප්‍රජාව තුළ පිළිගැනීමට ලක් කිරීමට විශාල වශයෙන් දායක විය. හක්ස්ලිගේ ස්වභාවිකවාදී දෘෂ්ටිය, විද්‍යාත්මක චින්තනයට විශාල බලපෑමක් සිදු කළ අතර, විද්‍යාව සහ ආගම අතර සම්බන්ධතාවය පිළිබඳව විවාදයක් ඇති කිරීමට දායක විය. රබීන්ද්‍රනාත් තාගෝර් (Rabindranath Tagore - ක්‍රි.ව. 1861 - 1941) ගේ දර්ශනය මගින් මානව ආත්මය සහ ස්වභාවික ලෝකය අතර සහජීවනයක් පැවතිය යුතු බව අවධාරණය කළේ ය. ඔහු ස්වභාවධර්මයේ අලංකාරය හා බලය අගය කළ අතර, ස්වභාවධර්මය තුළින් අධ්‍යාත්මික අවබෝධයක් ලබාගත හැකි බව විශ්වාස කළේ ය. තාගෝර්ගේ මෙම ස්වභාවිකවාදී දර්ශනය ඔහුගේ සාහිත්‍ය නිර්මාණ සහ අධ්‍යාපනික චින්තනය තුළින් පැහැදිලිව දැකගත හැකි ය. ජීන් ජැක් රූසෝ (ක්‍රිඃවඃ 1712 - Jean-Jacques Rousseau) දහඅට වැනි සියවසේ ජීවත් වූ ප්‍රංශ දාර්ශනිකයෙක් වන අතර, ඔහුගේ ස්වභාවවාදී දර්ශනය සමාජයට සහ අධ්‍යාපනයට ගැඹුරු බලපෑමක් ඇති කළේ ය. රූසෝ විසින් ස්වභාවික අධ්‍යාපන සංකල්පය දියුණු කළේ ය. ඔහු අධ්‍යාපනයේ දී වැදගත් මූලාශ්‍ර තුනක් ඇති බව විශ්වාස කළේ ය. ඒවා නම් ස්වභාව ධර්මය, මිනිසා සහ ද්‍රව්‍යයන් ය. පොතපත වෙනුවට ස්වභාව ධර්මය, නියමිත පාඨ ග්‍රන්ත ලෙස භාවිත කිරීමට යෝජනා කරයි. ළමයාට ඉගෙනුම් අත්දැකීම්, ස්වභාවධර්මය ඇසුරින් තමා විසින් ම ගොඩනගා ගැනීමට ඉඩ දිය යුතු බව කියයි. හැකියාවට ඉඩ ලබාදීමට යෝජනා කරයි. මෙහි දී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ඉස්මතු කර පෙන්වයි. ශිෂ්‍යයාගේ ස්වභාවය තේරුම් ගැනීමේ වැදගත්කම අවධාරණය කර ඇති අතර නිදහස හා ළමා කේන්ද්‍රීය ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය දෙන අධ්‍යාපනයේ සුසමාදර්ශීය වෙනසක් ඇති කරන බව ගෝපාල් දාස් (Gopal Das, 2024) අවධාරණය කරයි.

රූසෝගේ ස්වභාවවාදී දර්ශනයේ මූලික සංකල්ප අතර "ස්වභාවික මිනිසා'' (Natural Man) ඉතා වැදගත් වේ. රූසෝ විශ්වාස කළේ මිනිසා ස්වභාවයෙන් ම යහපත් බවත්, සමාජය විසින් ඔහුව දූෂණය කරන බවත් ය. සැමට ආදරය කිරීම, මිනිස් ස්වභාවය පිළිබඳ සම්පූර්ණ විශ්වාසය, යුක්තිය සඳහා සදාකාලික ආශාව, තෘප්තියෙන් වැඩ කිරීම, අන් අයගේ යහපැවැත්ම මෙහිලා සැලකෙන ඉතා වැදගත් සංකල්ප ලෙස ගෝපාල් දාස් (Gopal Das : 2024) පෙන්වා දෙයි. ස්වභාවික තත්ත්වය (State of Nature) යනු මිනිසා මුලින් ජීවත් වූයේ "ස්වභාවික තත්ත්වයේ ය" යන්නයි. එහි දී මිනිසුන් සරල, සාමකාමී ජීවිතයක් ගත කළ අතර, ඔවුන්ට අවශ්‍ය දේ ස්වභාවික පරිසරයෙන් ලබා ගත් බව යි. සමාජ ගිවිසුම (Social Contract) පිළිබඳ ඉගැන්වීමට අනුව රූසෝ විශ්වාස කළේ මිනිසුන් ඔවුන්ගේ ස්වභාවික නිදහස අත්හැර සමාජ ගිවිසුමකට එළඹීමෙන් සමාජය නිර්මාණය වූ බව යි. මෙම ගිවිසුම මගින් සාමාන්‍ය කැමැත්ත (General will) නිර්මාණය වන අතර, එය සමාජයේ යහපතට මඟ පෙන්වන බව රූසෝ පෙන්වා දෙයි. රූසෝගේ අධ්‍යාපන දර්ශනය ස්වභාවිකවාදය මත පදනම් විය. ඔහු විශ්වාස කළේ දරුවන්ට ඔවුන්ගේ ස්වභාවික හැකියාවන් වර්ධනය කිරීමට ඉඩ දිය යුතු බවත්, ඔවුන්ට ස්වභාවික පරිසරයේ අත්දැකීම් ලබා දිය යුතු බවත් ය. ස්වභාවික අධ්‍යාපනය (Natural Education) ලෙස ඔහු එය විග්‍රහ කළේ ය. ඔහුගේ "එමිල්'' (Emile) නම් කෘතියේ මෙම අදහස් විස්තර කර ඇත. රූසෝගේ දර්ශනයේ හැඟීම් සහ සංවේදනයන් වැදගත් ස්ථානයක් ගනී. ඔහු විශ්වාස කළේ මිනිසුන්ගේ ස්වභාවික හැඟීම් ඔවුන්ගේ තර්කනයට වඩා වැදගත් බව යි. රූසෝගේ ස්වභාවවාදී දර්ශනය රොමැන්ටික්වාදය සහ ප්‍රගතිශීලී අධ්‍යාපනය වැනි පසුකාලීන චින්තන සම්ප්‍රදායන්ට විශාල බලපෑමක් ඇති කොට තිබේ.

**උපයෝගීතාවාදය**

ඇමරිකානු ජාතික ජෝන් ඩිවී විසින් ඉදිරිපත් කරන ලද දර්ශනයකි, උපයෝගීතාවාද ය (Pragmatism). මෙය ප්‍රායෝගික අත්දැකීම් හා සම්බන්ධ ඉගැන්වීමකි. වර්ෂ 1800 පසුව එංගලන්තයේ ඇති වූ ආර්ථික පුනරුදය සමඟ උපයෝගීතාවාදී ගුරුකුලය බිහි විය. මෙමගින් ක්‍රියාව වැදගත් කොට සලකන අතර අත්දැකීම් හා අත්හදා

බැලීම් අගය කරමින් ප්‍රායෝගිකව දැනුම ලබා ගනියි. කිසිවක නිත්‍ය අගයක් විශ්වාස නොකරන දර්ශනයකි. වෙනස්වීම මූලික ලක්ෂණය බව සලකයි. එමෙන් ම ප්‍රජාතන්ත්‍රවාදය ගැඹුරින් අගය කරනු ලබන දර්ශනයක් වන බව රුබේරු (1997) පෙන්වා දෙයි.

උපයෝගීතාවාදයේ පුරෝගාමීන් වන්නේ පියර්ස්, ජෝන් ඩිවී, ජෝන්ලොක්, විලියම් ජේම්ස්, කිල් පැට්රික් යන අය යි. උපයෝගීතාවාදීන් අවධාරණය කරන්නේ සත්‍ය සෙවීම පර්යේෂණාත්මක ප්‍රවේශයක් බව යි. වෙනස් වන නිත්‍ය ලෝකයක වෙනස් නොවන පරමාර්ථ තබාගත නොහැක. මේ නිසා නිරතුරුවම දැනුම ගොඩනැගෙන්නේ කිසියම් ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස බව උපයෝගීතාවාදීන් පෙන්වා දෙයි. සත්‍ය යන්න එක් එක් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන අතර සෑම විට ම කේවල සත්‍යයක් නැතැයි ඔවුහු පෙන්වා දෙති. උපයෝගීතාවාදීන්ට අනුව මිනිස් ජීවිත පාලනය කරන අසහාය දෙවියකු හෝ වෙනත් බලවේගයක් නොමැත. ජීවත්වීමට අවශ්‍ය අරමුණු සහ සාරධර්ම මිනිසා විසින් ම එදිනෙදා ජීවිතයේ දී අත්දැකීම් මගින් සොයාගත යුතු වෙයි. අත්දැකීම් පිළිබඳ න්‍යාය (Theory of Experience) ඩිවී විසින් පසුකාලීනව ක්‍රියාවෙන් ඉගෙනීම (Learning by doing) ලෙසින් සංවර්ධනය කළේ එබැවිනි. චන්ද්‍රසේකර (2018) පෙන්වා දෙන පරිදි කලින් බැසගත් තීරණ, පරමාදර්ශයන්, අරමුණු, නිෂ්ටාවන් ප්‍රතික්ෂේප කිරීම ද උපයෝගීතාවාදීන්ගේ ස්වරූපය යි. අද සත්‍යය යැයි පිළිගත් දේ හෙට වෙනස් වන බැවින් පරම සත්‍යයක් නොමැත. නූපන් අනාගතය ගැන සිතා වර්තමානය කැප නොකළ යුතු බව පෙන්වා දෙන්නේ එබැවිනි. කීර්තිරත්න (2021) පෙන්වා දෙන පරිදි උපයෝගීතාවාදය මානවවාදී දර්ශනයකි. වර්තමානය පිළිබඳ විශ්වාසය තබන අතර වර්ධනය හා සංවර්ධනය අතර ආබද්ධතාව (Interation) පරිසරය ඇසුරින් සිදු වේ යැයි විශ්වාස කරන බව හෙතෙම වැඩිදුරටත් පෙන්වා දෙයි.

උපයෝගීතාවයේ ප්‍රභේද කිහිපයකි. මානවවාදී උපයෝගීතාව (Humanistic Pragmatism), ආනුභූතික උපයෝගීතාව (Experimantal Pragmatism), නාම මාත්‍ර උපයෝගීතාව (Nominalistic Pragmatism), ජීව විද්‍යාත්මක උපයෝගීතාව (Biological Pragmatism) ඒවා වේ. උපයෝගීතාවාදය හා අධ්‍යාපනය අතර සෘජු සම්බන්ධයක් දැකිය හැකි ය.

උපයෝගීතාවාදීන්ට අනුව අධ්‍යාපන අරමුණු ක්‍රියාවලියට සරිලන පරිදි වෙනස් වන නිසා විෂයමාලාව ඒ ඒ අවස්ථාවන්ට ගැළපෙන පරිදි නවීකරණය වන විෂයමාලාවක් තිබිය යුතු ය. කීර්තිරත්න (2021)ට අනුව සමාජමය වශයෙන් පිළිගැනෙන විෂයමාලාවක් උපයෝගීතාවාදීන් අවධාරණය කරයි. ඒ අනුව සිසුන්ගේ ලැදියා සහ හැකියාවන්ට ගැළපෙන කාලීන විෂයමාලාවක් ඇතුළත් කළ යුතු ය. ශිෂ්‍ය කැමැත්ත මත විෂයන් තේරීම, ස්වභාව අධ්‍යයනයෙහි යෙදීම, ආකෘති හා ක්‍රියාකාරකම් මගින් අවස්ථා සම්පාදනය කිරීම, ගැටලු විසඳීම, සජීවී අත්දැකීම් ඇසුරෙන් සිදු කිරීම අත්‍යාවශ්‍ය වේ. ප්‍රායෝගික වැඩ සහිත විෂයමාලාවක අවශ්‍යතාවන් ඇති බව මෙමගින් ප්‍රකට වෙයි. උපයෝගීතාවාදීන්ට අනුව අත්දැකීම් ඉතා වැදගත් සාධකයක් වන අතර ඒවා වර්තමානයට මෙන් ම අනාගතයට රුකුලක් වන බව පෙන්වා දෙයි. උපයෝගීතාවාදීන්ට අනුව වඩාත් සුදුසු වන්නේ ශිෂ්‍ය කේන්ද්‍රීය විෂයමාලාවකි. උපයෝගීතාවාදීන්ට අනුව පුද්ගලිකත්වයට මුල් තැන දෙමින්, පුද්ගල විවිධතා සැලකිල්ලට ගනිමින් අත්දැකීම් ලබා ගැනීමට උචිත ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතු බව චන්ද්‍රසේකර (2018) පෙන්වා දෙයි. ප්‍රායෝගික අධ්‍යාපනය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ක්‍රියාකාරී සහ වගකිවයුතු පුරවැසිභාවය සඳහා සිසුන් සූදානම් කිරීම අරමුණු කරයි. උපයෝගීතාවාදය වර්තමාන සමාජය තුළ තිරසර, සාධාරණ හා සමතුලිත සංවර්ධනයන් පවත්වා ගැනීමට උපකාරී වේ.

**අධිභෞතිකවාදය**

අධිභෞතිකවාදය (Metaphisics) යනු යථාර්ථයේ මූලික ව්‍යුහය පරීක්ෂා කරන දර්ශනයේ ශාඛාවයි. චන්ද්‍රසේකරට (2018) අනුව අධිභෞතික යනුවෙන් අදහස් කරන්නේ භෞතික නැතහොත් ද්‍රව්‍යමය තත්ත්වයෙන් එපිට යන්නයි. අධිභෞතිකවාදයේ දී පවතින දෙයෙහි මූලික ව්‍යුහය හා කොටස් අධ්‍යයනය සිදු කරන බව කීර්තිරත්න (2021) පෙන්වා දෙයි. තාර්කික අධ්‍යයනය මෙහි පදනමයි. අවකාශය හා කාලය තුළ පවත්නා දේ පමණක් නොව දර්ශනය නොවන දෙය ද මෙහි දී සාකච්ඡා කිරීම විශේෂ වේ. එනම් දෙවියන් යනු කවුද..? විශ්වයේ ව්‍යුහය කුමක්ද..? පුද්ගලයා යනු කවරෙක්ද..? බලයක් සහිත අයෙක් වේද..? යථාර්ථය යනු කුමක් ද..? අප ජීවත්වන ලෝකයේ

ස්වභාවය කෙබඳුද..? යනාදිය ඊට නිදසුන් ය. අධිභෞතිකවාදය පාරභෞතිකවාදය වශයෙන් ද හඳුන්වනු ලබයි.

අධිභෞතිකවාදය සවිස්තරාත්මක ලෙස අවබෝධ කර ගැනීම පිණිස ප්‍රධාන ක්ෂේත්‍ර ත්‍රිත්වයක් යටතේ එය විග්‍රහ කෙරේ. එනම්,

1. පැවැත්මේ ස්වභාවය කුමක්ද යන්න අධ්‍යයනය කිරීම (ONTOLOGY)
2. විශ්වයේ ආරම්භය හා සංවිධානය පිළිබඳව සොයා බැලීම (COSMOLOGY)
3. මිනිසා, දෙවියන් හා විශ්වයේ ඇති සබඳතා මොනවාද යන්න විමසීම (THEOLOGY) වේ.

පැවැත්ම, අධිභෞතිකවාදයේ උප විෂයක් ලෙස හඳුන්වා දිය හැකි ය. පැවැත්ම, විස්තර සහ විශ්වීය කාණ්ඩ වශයෙන් වර්ගීකරණය කර ඇත. යථාර්ථවාදය, විශ්වීය දේවලට පැවැත්මක් ඇති බව ප්‍රකාශ කරන අතර සංකල්පවාදය, විශ්වීය දේ මනස තුළ පමණක් පවතින බව ප්‍රකාශ කරයි. නාමිකවාදය ඒවායේ පැවැත්ම ප්‍රතික්ෂේප කරයි.

අධිභෞතිකවාදයේ ලක්ෂණ කිහිපයකි. යථාර්ථය යනු නිසැකවම පවතින්නකි, යථාර්ථයට සුවිශේෂී ස්වභාවයක් ඇත, සෑම ක්‍රියාවකට ම හේතුවක් හා ඵලයක් ඇත යනා දී ලක්ෂණ ප්‍රධාන වේ. සියලු ම වස්තූන් හා සිතිවිලි භෞතික ද්‍රව්‍යවලට අයත් බව, මනෝභාව/චේතනා වැනි දේවල් මොළයේ භෞතික ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලයක් බව, ආත්මයක් හා භෞතික නොවන මානසික ස්වභාවයක් ඇති බව, විද්‍යාත්මක ක්‍රමවේදයන් මගින් විශ්වය පැහැදිලි කර ගත හැකි බව, අත්දැකීම් හා පරීක්ෂණාත්මක සාක්ෂි මත පදනම්ව සත්‍ය තීරණය කළ යුතු බව සෙසු ලක්ෂණ වේ. අධ්‍යාපන ක්‍රියාවලිය, ආචාරශීලී ක්‍රියාමාර්ග සහ මනෝභවික විග්‍රහයන් සඳහා අධිභෞතිකවාදය විසින් ආලෝකයක් සපයයි.

**ඥාන විභාගවාදය**

ඥානවිභාගය (Epistemology), අප සිතන ආකාරය විස්තර කරයි. ඥාන විභාගයක් නොමැතිව සිතීමක් නොමැත. ඥානවිභාගය

වැරදි දෙයින් සත්‍ය වෙන් කොට දක්වයි. ඒ අනුව ඥානවිභාගය යනු සත්‍යය හා විශ්වාසය තහවුරු කිරීම සඳහා දැනුම යොදා ගන්නේ කෙසේද යන්න අධ්‍යයනය කිරීම ලෙස ද දැක්විය හැකි ය. දැනුම යනු කුමක් ද? දැනුම ලබා ගන්නේ කෙසේද? මිනිසුන් දැනුම ලබා ගන්නේ කෙසේ ද? අපි දන්නා දේ අපි දන්නේ කෙසේ ද? අපි දන්නා දේ අපි දන්නේ ඇයි? යනා දී ප්‍රශ්නවලට පිළිතුරක් සපයන බව කීර්තිරත්න (2021) පෙන්වා දෙයි.

සොක්‍රටීස් සඳහන් කරන ආකාරයට දර්ශනයේ අරමුණ පරම ඥානය හා සාධුත්වය ලබා ගැනීමයි. සොක්‍රටීස්ගේ ප්‍රධාන අපේක්ෂාව වූයේ ඥානය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමයි. ''ඥානය, සත්ගුණය වේ. සත්ගුණය, ඥානය වේ'' යන්න සොක්‍රටීස්ගේ විශිෂ්ට කියමනකි. ඥානය සහ සදාචාරය අතර සම්බන්ධතාවක් බිහි කළ පළමු අපරදිග දාර්ශනිකයා මොහු ය. ඉන්ද්‍රියානුසාරීව ගොඩනැගෙන ඥානය සාපේක්ෂ බව සොක්‍රටීස් පවා පිළිගන්නා අතර සැබෑ ''ඥානය'' යන්න ගොඩ නැගෙන්නේ ඉන්ද්‍රියානුසාරීව නොවන බව සොක්‍රටීස්ගේ මතය යි. ඉන්ද්‍රිය ගෝචර හා බුද්ධිගෝචර යනුවෙන් ඥානයේ ප්‍රභේද දෙකක් ඇති බව දක්වන මොහු වඩා වැදගත් කොට සළකන්නේ බුද්ධිගෝචර ඥානය යි. මොහු ඥානය වශයෙන් හඳුන්වා දෙන්නේ සංකල්ප තුළින් ලැබෙන දැනුමයි. එනම් ඉන්ද්‍රිය සංවේදනයන්ට අනුව මනසේ ගොඩ නැගෙන සංකල්පයන්ට ය. සංකල්ප පවතින්නේ බුද්ධිය නිසාවෙනි. තර්කයන් ගොඩ නැගීමට හේතුව බුද්ධිය යි.

ප්ලේටෝ ක්‍රි. පූ. 428-328 අතර කාලය තුළ අපරදිග දර්ශනය කෙරෙහි දැඩි බලපෑමක් කළ දාර්ශනිකයෙකි. මොහුගේ දර්ශනය මෙතෙක් ග්‍රීසියේ අඩුලුහුඬු තැන් සකස් කොට ඉදිරිපත් කළ නව දර්ශනයකි. ප්ලේටෝ ඇකඩමි නම් ආයතනයේ දර්ශනය හැදෑරීමට කැමති පිරිසට නිශ්ශබ්දතාවයෙන් ඉගෙනීමට අවස්ථාව ලබා දීම තුළින් යහපත් පාලකයින් බිහි වීම අපේක්ෂා කර ඇත. ප්ලේටෝගේ දර්ශනය කොටස් 02කට බෙදේ එනම්, ඥාන විභාගය හා දේශපාලන දර්ශනය වශයෙනි. ප්ලේටෝගේ ඥාන විභාගය ආරම්භ වන්නේ සමකාලීන යුගයේ පැවති විතණ්ඩවාදීන්ගේ අදහස් ප්‍රතික්ෂේප කරමිනි. ප්ලේටෝ දක්වන ආකාරයට සැබෑ ඥානය ඉන්ද්‍රියානුසාරී ස්වභාවයෙන් පිටත පවත්නා දෙයකි. ඒ අනුව ඉන්ද්‍රිය ඥානයක් තුළින් දැනුමක් ලබා දීම සත්‍යයකි.

ඥානය යනුවෙන් ඔහු අදහස් කරන්නේ පරිපූර්ණ ඥානය යි. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළින් පරිපූර්ණ ඥානයක් ලැබිය නොහැක. සත්‍යයක් නම්, ඥානයක් නම් කිසිවිටකත් වෙනස් විය නොහැක. ඒවා සදාකාලික යැයි ප්ලේටෝ දක්වයි. ප්ලේටෝ අදහස් කරන ඥානය වහා ඇති වී නැති වී යන්නක් නොවේ. ප්ලේටෝ අදහස් කරන ඥානය භෞතික ලෝකය තුළ පවත්නා දෙයක් නොවේ. සැබෑ ඥානය ස්පර්ශ කළ නොහැක. මේ ඥානය ඔහු පැහැදිලි කරන්නේ ගුප්ත ප්‍රතිභාවක් වශයෙනි. එය පවතින්නේ ආකෘතික ලෝකයේ ය. ප්ලේටෝ විසින් යථාභූත ඥානයක් පිළිබඳ අදහස් ඉදිරිපත් කර තිබුන ද එය සාක්ෂාත් කළ හැකි මාර්ගයක් පිළිබඳ අදහස් ඉදිරිපත් නොකිරීම නිසා ඔහුගේ දර්ශනයේ කිසියම් ඌණතාවක් පෙන්වයි.

දැනුම යනු කුමක් ද? සහ එය විශ්වාසයෙන් හෝ මතයෙන් වෙනස් වන්නේ කෙසේ ද? සත්‍යය යනු කුමක් ද? ප්‍රකාශයක් සත්‍ය දැයි අපට දැනගත හැක්කේ කෙසේ ද? දැනුමේ මූලාශ්‍ර මොනවා ද? විශ්වාසය සහ තර්කය අතර සම්බන්ධය කුමක් ද? ආදී ගැටලු මෙම දර්ශනවාදී ගුරුකුලය ප්‍රකට කරයි. ඥාන විභාගය අධ්‍යාපනයට මොහොතින් මොහොත සෘජු බලපෑමක් ඇති කරයි. නිදසුනක් වශයෙන් විවිධ දැනුම් මූලාශ්‍රවල වැදගත්කම පිළිබඳ උපකල්පන විෂයමාලා සහ ඉගැන්වීම් ක්‍රමවේද තුළ නිසැකවම පිළිඹිබු වේ.

**මාක්ස්වාදය**

මාක්ස්වාදය (Marxism) නොහොත් විද්‍යාත්මක සමාජවාදය යනු, කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසින් ප්‍රථම වරට සකස් කරන ලද අදහස් සමූහයට ලබා දුන් නාමය යි. එය ආරම්භ වන්නේ 19 වැනි සියවසේ දී පමණ වේ. මෙම අදහස් එකතුව විසින්, මානව සමාජය වඩා ඉහළ අවධියක් කරා ගෙන යාම වෙනුවෙන් වන කම්කරු පන්ති අරගලයට සම්පූර්ණ දායකත්වයක් ලබා දී ඇති බව මෙම ගුරුකුලය විමර්ශනය කිරීමේ දී අපට හඳුනාගත හැකි වේ. සමාජ ප්‍රගමනය තුළ කම්කරු පන්තියේ භූමිකාව වඩාත් හොඳින්, යථාර්ථවාදී හෝ විද්‍යාත්මක ලෙසින් පැහැදිලි කළ වෙනත් අයෙකු මාක්ස් සහ එංගල්ස්ගේ කාලයට පෙර හෝ පසු නොවී ය. එබැවින් මාක්ස්වාදී දැනුම විසින් සමාජය සමාජවාදී පරිවර්තනයක් කරා ගෙන

යාමේ ඓතිහාසික කාර්යය වෙනුවෙන් නිර්ධන පංතිය න්‍යායාත්මකව සන්නද්ධ කරයි. හිල් (Hill, 2018) ට අනුව ධනේෂ්වර නිෂ්පාදන ක්‍රමය යනු කම්කරු පන්තිය, ධනපති පන්තිය විසින් සූරා කෑමේ පද්ධතියකි. මාක්ස්වාදය න්‍යායික පොකුරු තුනක් වටා ගොඩනැගී ඇති බව Burawoy & Wright (2001) පෙන්වා දෙයි. ඒවා නම් ධනවාදයේ ගමන්පථය සහ ඉරණම පිළිබඳ න්‍යාය, ධනවාදයේ පරස්පර විරෝධී ප්‍රතිනිෂ්පාදනය පිළිබඳ න්‍යාය හා සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය පිළිබඳ සම්මත න්‍යාය වශයෙනි. මාක්ස්වාදය කාලයාගේ ඇවෑමෙන් විවිධ ශාඛා සහ චින්තන ගුරුකුල දක්වා වර්ධනය වී ඇති බැවින්, දැනට තනි, නිශ්චිත මාක්ස්වාදී න්‍යායක් නොමැත. සමහර මාක්ස්වාදී චින්තන ගුරුකුළ, සම්භාව්‍ය මාක්ස්වාදයේ ඇතැම් අංග කෙරෙහි වැඩි අවධාරණයක් ලබා දෙන අතර ම අනෙකුත් පැති ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනස් කිරීම සිදු කරයි.

අධ්‍යාපනය පිළිබඳ මාක්ස්වාදී දෘෂ්ටිකෝණය නිර්මාණය වී ඇත්තේ කාල්මාක්ස් හා ෆෙඩ්‍රික් එංගල්ස් විසින් වර්ධනය කරන ලද පුළුල් න්‍යායික රාමුව තුළ ය. මාක්ස්වාදී ඉගැන්වීම් අධ්‍යාපන සංවර්ධනය කෙරෙහි බොහෝ සෙයින් බලපා ඇති අතර ප්‍රධාන වශයෙන් ධනේශ්වර පුද්ගල සමාජය තුළ අධ්‍යාපනය ක්‍රියාත්මක වන අයුරු පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයන් ඇතුළත් වෙයි. මාක්ස්වාදී දෘෂ්ටිකෝණය තුළ අධ්‍යාපනය යනු දැනුම හා කුසලතා ලබාදීමට නිර්මාණය කරන ලද මධ්‍යස්ථ ආයතනයක් පමණක් නොව පන්ති බෙදීම් පවත්වාගෙන යන පාලක පන්තියේ ආධිපත්‍ය පවත්වා ගන්නා ක්‍රියාවලියකි. කෝලේ (Cole, 2019) පෙන්වා දෙන්නේ අධ්‍යාපනය ධනවාදය ප්‍රතිනිෂ්පාදනය කරන අතර ම එය අඩපණ කිරීමේ විභවයක් ද සහිත බව යි.

මාක්ස්වාදී අධ්‍යාපනයේ අරමුණු රැසකි. මාක්ස්වාදී අධ්‍යාපනය මගින් අදහස් හා භාවිතයන් ඉගැන්වීම කෙරෙහි අවධාරණය කරයි. මාක්ස්වාදී ආකල්ප හා සාරධර්ම නිර්මාණය කිරීම එහි මූලික අරමුණ වේ. නිර්ධන පන්තිය විසින් මාක්ස්වාදී රාජ්‍යයක ආධිපත්‍ය දරමින් අධ්‍යාපනය අතලොස්සකට පමණක් සීමා නොවී සමාජයේ සියලු සමාජ කොටස්වලට අධ්‍යාපනය ලබා දීම හෙවත් විශ්වීය අධ්‍යාපනය ලබාදීම මාක්ස්වාදය අවධාරණය කරයි. මාක්ස්වාදී අධ්‍යාපන

චින්තනය, චන්ද්‍රසේකර (2018) මෙසේ කරුණු වශයෙන් පෙන්වා දෙයි.

- සියලු ම ළමයින් සඳහා රජයේ පාසල්වල නොමිළයේ අධ්‍යාපනය ලබා දීම
- ළමයින් රැකියාවල යෙදවීම නතර කිරීම
- මූලික අධ්‍යාපනයේ සිට ම නිෂ්පාදනය සඳහා භාවිත කෙරෙන සරළ උපකරණ හැඳිනීම හා භාවිතය පිළිබඳ පුහුණුව ලබා දීම
- පාසල් ඉගෙනීමේ කටයුතුවලට අමතරව දරුවාට හස්ත කර්මාන්තය ද පුහුණු කළ යුතු බව

මාක්ස්වාදී අධ්‍යාපනය තුළින් උපරිම යහපතක්, උපරිම සංඛ්‍යාවක් දක්වා අරමුණු කරයි. එමගින් සමාජ ප්‍රගමනය සහතික කිරීමට උත්සුක වෙයි. එබැවින් සමාජ පරිවර්තනයේ ප්‍රධාන මෙවලමක් ලෙස සලකන්නේ අධ්‍යාපනය යි. බුද්ධිමය අධ්‍යාපනයෙන් පමණක් මෙම ඉලක්කය සපුරා ගත නොහැකි වන බැවින්, මාක්ස්වාදය තුළ වෘත්තීය හා තාක්‍ෂණික අධ්‍යාපනය කෙරෙහි ද අවධානය යොමු කරයි. දරුවන්ට ඉතිහාසය හා ආර්ථික විද්‍යාව මෙන් ම විද්‍යාවේ මූලධර්ම දැක්මක් සහිතව ඉගැන්වීම අවධාරණය කරයි. ශාරීරික අධ්‍යාපනය, සංස්කෘතික හා සෞන්දර්යාත්මක අධ්‍යාපනය මෙන් ම කොමියුනිස්ට් හා සමාජවාදී සාරධර්ම ඉගැන්වීම අරමුණු කොට තිබේ. ගුරුවරයාගේ ඉගැන්වීමේ කටයුතු කර්මාන්තයක් නොව දරුවාගේ අභ්‍යන්තර ලෝකයේ වර්ධනය නියමාකාරයෙනුත් ඔහුගේ පුද්ගලික ගුණාංග පිළිබඳව ගැඹුරු දැනුමක් බල කර සිටින කලාවක් බවත් මාක්ස්වාදීන්ගේ ඉගැන්වීමයි (චන්ද්‍රසේකර, 2018). ලෙනින්ට අනුව අධ්‍යාපනය, සංස්කෘතියේ අනිවාර්ය අංගයකි. සංස්කෘතික දියුණුව සඳහා පදනම "ශ්‍රමය" වන බැවින් මාක්ස්වාදී අධ්‍යාපනය තුළ ශ්‍රමයට හිමිවන්නේ වැදගත් ස්ථානයකි.

මාක්ස්වාදී දර්ශනයේ දී දරුවාගේ අධ්‍යාපනය බොහෝ දුරට රඳා පවතින්නේ මවගේ අධ්‍යාපනය මත බව පිළිගනියි. එබැවින් මාක්ස්වාදී අධ්‍යාපනයේ දී කාන්තා අධ්‍යාපනය මූලිකව අරමුණු කරයි.

ළමා මනස වර්ධනය කිරීම අවසාන අරමුණයි. සම අධ්‍යාපනය මාක්ස්වාදය පිළිගත් මූලධර්මයකි. එහි දී ජාති, ආගම්, කුලභේද, ස්ත්‍රී පුරුෂ භේද, ආර්ථික තරාතිරම නොබලා අධ්‍යාපනය ලබා දිය යුතු ය. පාසල් අතර කිසිදු වෙනස්කමක් නොතිබිය යුතු ය.

මාක්ස් පවසන පරිදි අධ්‍යාපනය කරුණු තුනක් ඔස්සේ දිවෙයි.

- බුද්ධිමය සංවර්ධනය
- භෞතික සංවර්ධනය හෙවත් ශාරීරික සංවර්ධනය
- සාමාන්‍ය විද්‍යාවන් හා බහුතාක්ෂණික අධ්‍යාපනය (Cole, 2019).

මාක්ස්වාදී විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී පන්ති භේදය, ධනය අසමාන ලෙස බෙදීයාම, ධනපති පන්තිය විසින් කම්කරු පන්තිය සූරාකෑම යනාදිය පිළිබඳ සිසුන් දැනුම්වත් කළ යුතු ය. කුසලතා වර්ධනය කිරීමට නැඹුරු වන විෂයන් විෂයමාලාවට ඇතුළත් කළ යුතු ය. ශ්‍රමයට ගරු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති බැවින්, රැකියා පලපුරුද්ද අධ්‍යාපනයේ අනිවාර්ය අංගයක් ලෙස සැලකේ. විද්‍යාව, භූගෝල විද්‍යාව, ගණිතය, ජීව විද්‍යාව, භූ විද්‍යාව, තාරකා විද්‍යාව, වැනි සමාජීය වශයෙන් ප්‍රයෝජනවත් විෂයන් ඇතුළත් වන අතර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඉතිහාසය, දේශපාලනය හා ආර්ථිකය ද විෂයමාලාවට ඇතුළත් කළ යුතු බව බරානොව් ස්ලස්තියෝනින්ගේ "සෝවියට් පැසල් අධ්‍යාපනය" නම් කෘතියෙහි (පිට 54) දැක්වෙයි (චන්ද්‍රසේකර, 2018). ප්‍රාථමික මට්ටමේ දී මව් භාෂාව පමණක් ඉගැන්විය යුතු ය. එහෙත් ද්විතීක මට්ටමේ දී විදේශ භාෂාවන් විෂයමාලාවට ඇතුළත් විය යුතු වේ. මාක්ස්වාදය යනු කම්කරු පන්තිය නිදහස් කිරීමේ හා සමාජය සංවිධානය කිරීමේ මූලික න්‍යායවේදයක් වේ. එමගින් ඉතිහාසය සහ ආර්ථිකය පිළිබඳව නව අදහස් ලබාදිය හැකි වේ. අධ්‍යාපනය හා ආර්ථික ක්‍රම සම්පූර්ණයෙන් ම පන්ති සටනක් තුළින් පාලනය වේ යන මාක්ස්වාදී මතය නිර්මාණය වී ඇත. වර්තමානයේ දී, මාක්ස්වාදය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක නොවන නමුත්, එය ආර්ථිකය සහ සමාජය අධ්‍යයනය සඳහා තවදුරටත් වැදගත් වේ.

## සමාලෝචනය

අධ්‍යාපනය හා දර්ශනය අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවකි. ලොව ඕනෑ ම රටක අධ්‍යාපනය කෙරෙහි බලපෑම් කරන ලද දාර්ශනික චින්තාවන් වේ. දර්ශනය විෂය පුළුල් පරාසයක විහිද ගොස් ඇත්තේ ඒ ඒ කාලවල ජීවත් වූ විවිධ දාර්ශනිකයින් විවිධ විෂය තේමා ඔස්සේ දර්ශනයට ප්‍රවේශ වීමත් සමග වේ. ආගම, ගණිතය, විද්‍යාව, දේශපාලනය වැනි විවිධ විෂය ඔස්සේ තාර්කික පදනමක් සහිත අදහස් ඉදිරිපත් කිරීම තුළින් මෙම විෂයෙහි සංවර්ධනය සිදුව තිබේ. සෑම අධ්‍යාපනික දාර්ශනික ගුරුකුලයක් ම බිහි වූයේ ද මෙම ස්වභාවයෙහි බලපෑම මත වේ. දර්ශනයට විෂය වූ කරුණු හා එම කරුණු විභාග කළ විවිධ ප්‍රවේශයන් අනුව මෙම දර්ශනවාදී ගුරුකුල බිහි වී තිබේ. ඒ ඒ ගුරුකුලයන්හි බලපෑම විවිධ රටවලට හා කලාපවලට විවිධාකාරයෙන් බලපෑම් කොට ඇති අයුරු තුලනාත්මක හා ජාත්‍යන්තර අධ්‍යාපනය හැදෑරීමෙන් අවබෝධ කරගත හැකි ය. අධ්‍යාපනයේ අරමුණු, විෂයමාලාව, ගුරු කාර්යභාරය, ශිෂ්‍යයාගේ වගකීම, කළමනාකරණ ශිල්පක්‍රම, පාසැල් යාන්ත්‍රනය ලොව විවිධ රටවල හා කලාපවල විවිධාකාරයෙන් නිර්මාණය වීමට හේතු වී ඇත්තේ මෙම ස්වභාවය යි. මෙම ස්වභාවය මත කිසිදු අධ්‍යාපනික පද්ධතියක් හොඳ හෝ නරක යැයි නිගමනය කිරීමට අපහසු වී තිබේ. මන්ද යත් සෑම අධ්‍යාපන පද්ධතියක් ම වර්තමාන ගෝලීය අභියෝග හා මුසු වෙමින් අනාගතය කරා පියමන් කරන බැවිනි. වෙනස ඇත්තේ ඒ සඳහා ඔවුන් අනුගමනය කරන ක්‍රමවේද විවිධ දාර්ශනික ගුරුකුලයන්හි ඉගැන්වීම් මත පදනම් වීම වේ. අනාගත ගෝලීය ඉලක්ක හා මුසු වීමේ දී ඒ ඒ දාර්ශනික ගුරුකුලයන්හි මතවාදී ඉගැන්වීම් ද වෙනසකට ලක්කර ගනු දැක ගත හැකි ය. එය අධ්‍යාපනයේ උන්නතියට මිස අයහපතට හේතු නොවනු නිසැක ය.

## ආශ්‍රිත මූලාශ්‍ර නාමාවලිය

රංජිත්, ආර්. (1997). *නව අධ්‍යාපන සංකල්ප.* කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

චන්ද්‍රසේකර, එච්. එම්. (2018). *අධ්‍යාපනයේ දාර්ශනික පදනම.* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

සේනාධීර, සිල්වි සහ වනසිංහ, ශාමින්ද (2016), *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශ*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එදිරිසිංහ, ඩී. සහ පෙරේරා, ජී. (2001), *දාර්ශනික විමර්ශන*. දෙහිවල: වත්මා ප්‍රකාශකයෝ.

Aliman, L.P.T.A. and Nabua, E.B. (2020). *IDEALISM AND ITS IMPLICATION TO EDUCATION*, ResearchGate.

Bourne, P. A. (2024). Epistemology and Education. *International Journal of Transformation in English & Education - Vol. 9*, Issue 1 – 2024.

Burawoy, M., Wright, E.O. (2001). *Marxism in Contemporary Sociology*. International Encyclopedia of the Social & Behavioral Sciences. ScienceDirect. Pages 9295-9298

Chamling Rai, P. and Lama, R. (2020). PRAGMATISM AND ITS CONTRIBUTION TO EDUCATION. IJCRT2003258 *International Journal of Creative Research Thoughts* (IJCRT). | ISSN: 2320-2882.

Cole, M. (2019) *Marxism and Educational Theory*, Education. Oxford University Press. https://doi.org/10.1093/acrefore/9780190264093.013.105

Crotty, M. (2005). *The foundations of social research: Meaning and perspective in the research process*. London: SAGE.

Ferdiana, R.M. (2023). *Philosophy of Naturalism. Journal of Innovation in Teaching and Instructional Media* 4(1):19-27. DOI:10.52690/jitim.v4i1.721

Gopal Das (2024). Implications of Naturalism in Education: A Comprehensive Analysis. *RJPSSs, Vol. L No.2*, Dec. 2024 ISSN: (P)0048-7325 (e) 2454-7026 Impact Factor 8.904 (SJIF) https://doi.org/10.31995/rjpsss.2024v50i02.35

Hill, D. (2018) Education and social class: a Marxist response. In R. Simmons and J. Smyth (eds.), *Education and Working Class Youth*. London: Palgrave MacMillan.

Kristiawan, M. (2016). *Philosophy of Education*, The Choice is Yours. Yogyakarta: Valia